**වර්ගය:** අනිවාර්ය

**පාඨමාලා සංකේතය:** CHCU E2025

**මාතෘකාව:** ක්‍රිස්තියානි කලාව සහ සාහිත්‍යය

**පූර්ව අවශ්‍යතා:** ක්‍රිස්තියානි සංස්කෘතිය පළමු ස්තරයේ පරීක්ෂණසම්පූර්ණ කිරීම.

**අරමුණු සහ අභිප්‍රේතාර්ථ:** මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ ක්‍රිස්තියානි කලාවේ වර්ධනය ඓතිහාසික ප්‍රගමනය තුළ පිරික්සීම සහ ක්‍රිස්තියානි සාහිත්‍ය කෘති කීපයක් අධ්‍යයනය කිරීමයි.

**ඉගෙනුම් ඵල:** මෙම පාඨමාලාව අවසානයේ දී ක්‍රිස්තියානි ධර්මයේ සහ වන්දනා ක්‍රමවල බලපෑමට ලක් වූ කලාවේ විවිධ ලක්ෂණ සාකච්ඡා කිරීමට සහ ක්‍රිස්තියානි සාහිත්‍ය කෘතීන් විවේචනාත්මකව විමර්ශනය කිරීමටත්, ඒවායේ සෞන්දර්යාත්මක වටිනාකම අවබෝධ කර ගැනීමටත් ශිෂ්‍යයන්ට හැකි වේ. මේ සඳහා ක්‍රිස්තියානි සාහිත්‍යයේ විෂය පථයට ප්‍රඥා සාහිත්‍යයේ පොත් ද අන්තර්ගත කිරීම අවශ්‍ය වේ.

**පාඨමාලා අන්තර්ගතය:**

**පළමු කොටස: ක්‍රිස්තියානි කලාව**

1.**මුල් යුගයේ ක්‍රිස්තියානි කලාව:** කැටකොම්බ්ස්, ගෘහ දේවස්ථාන සහ ගලින් කළ මිනී පෙට්ටි (කැටයම් සහ ලේඛනයෙන් යුත්) කලාව, මුල් යුගයේ ක්‍රිස්තියානි දේවස්ථාන ගෘහ නිර්මාණ ශිල්පය.

2.**බයිසන්තියානු කලාව:** බයිසන්තියානු දේවස්ථාන, ගෘහ නිර්මාණ ශිල්පය සහ එහි බිත්ති අලංකරණය, බයිසන්තියානු අයිකොන් කලාව.

3.**ගොතික් කලාව:** ගොතික් දේවස්ථානවල ලක්ෂණ, වර්ණ වීදුරු කලාව පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් ගොතික් දේවස්ථානවල අලංකරණය පිළිබඳ අධ්‍යයනය.

4.**පුනරුද කලාව:** පුනරුද ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති සහ චිත්‍රවල ආවේණික ලක්ෂණ.

**5.බැරොක් කලාව:** බැරොක් කලාවේ ආවේණික ලක්ෂණ.

**6.ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි කලාව:** ශ්‍රී ලංකාවේ දේවස්ථාන ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර කලාව, නුවර ත්‍රිත්ව විද්‍යාලයීය දේවස්ථානයේ සහ බඩල්ගම ශාන්ත මරියා දේවස්ථානයේ චිත්‍ර සහ ගෘහ නිර්මාණ ශිල්පය, ජෝර්ජ් කීට්, ඩේවිඩ් පේන්ටර් සහ රිචර්ඩ් ගේබ්‍රියෙල්ගේ කලා නිර්මාණ.

**දෙවන කොටස: ක්‍රිස්තියානි සාහිත්‍යය**

සාහිත්‍යකරණය කෙරෙහි ක්‍රිස්තියානි බලපෑම පිළිබඳ උදාහරණ වශයෙන් පහත සඳහන් කෘති ආශ්‍රයෙන් කෙරෙන අධ්‍යයනයක්: පැරණි ගිවිසුමේ සඳහන් වන ජෝබ් කථාව සහ ප්‍රේම ගීවල සාහිත්‍යමය විචාරාත්මක අධ්‍යයනයක්.

ජෙෆ්රි චෝසර් - කැන්ටබරි කථාවල පූර්විකාව,
ජෝන් බනියන් - මහමූකලාන මැදින්,
ලියෝ ටෝල්ස්ටෝයි - මිනිසෙකුට කොතරම් බිම් ප්‍රමාණයක් අවශ්‍ය ද?,
තෝමස් ග්‍රේ - සුසාන කාව්‍යය, ෆ්‍රැන්සිස් තොම්සන් - සුරලොවේ දඩයක්කාර සුනඛයාණෝ,
ටී.එස්. එළියට් - රජ තුන්කට්ටුවේ ගමන,
ජාකෝමේ ගොන්සල්වෙස් - වේද කාව්‍යය.

**අත්‍යවශ්‍ය කියවීම්:** ප්‍රමිදු කොටස හෙවත් මොඩියුලයේ ඇති නියමිත ග්‍රන්ථ.

**ක්‍රමවේදය:** දේශන, සාකච්ඡා, දෘශ්‍ය මාධ්‍ය භාවිතය සහ ප්‍රස්තුතීකරණ මගින්

**ඇගයීමේ ක්‍රමය:** වර්ෂාවසාන විභාගය

**නිර්දේශිත කියවීම්:**

*Encyclopedia of World Art*. (1960-1965). McGraw Hill, NY. (relevant articles)

Gardner, H. (1948). *Art through the Ages*. Harcourt, Brace, NY.

Gombrich, E.H. (1986). *The Story of Art.* Oxford:Phaidon,.

Halpe, A. (1977). "Painting and Sculpture" in : K.M. de Silva (ed.) *Sri Lanka : A. Survey*. University Press of Hawaii, 460-465.

Hartt, F. (1976). A *History of Painting, Sculpture and Architecture*. Prentice-Hall - Abrams, NY.

Matthew, G. (1963). *Byzantine Aesthetics*, London:John Murray.

Pevsner, N. (1951). *An Outline of European Architecture*. Penguin, Harmondsworth, Middlesex.

ලෝව්, නීටා. (2012). *ප්‍රඥා සාහිත්‍යයේ ජෝබ් විවරණය සහ දෙව් මිනිස් සබඳතාව*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

ප්‍රනාන්දු, ඒ. (1996). *ආරම්භයේ සිට අද දක්වා ක්‍රිස්තියානියේ ඉතිහාසය, සාහිත්‍ය හා කලාව*. කඩවත: අන්තර් සංස්කෘතික පොත් ප්‍රකාශකයෝ.